# ඩෙංගු රෝගයෙන් රත්නපුරට දැඩි අවදානමක්

## පාලනයට හමුදාවෙන් 80ක් යොදවයි

## රෝහල් කාර්ය මණ්ඩලයේ 166කුත් ගොදුරු වෙති

## සේවයට නව හෙද නිලධාරීන් 50ක් බඳවා ගැනීම අද

**කහවත්ත - ලසන්ත නිරෝෂණ පෙරේරා**

රත්නපුර දිස්ත්‍රික්කයේ ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා සබරගමු පළාත් ආණ්ඩුකාර චම්පා ජානකී රාජරත්න මහත්මියගේ මැදිහත්වීමෙන් ශ්‍රී ලංකා යුද හමුදාව කැඳවීමට පියවර ගෙන ඇත.

ඒ අනුව, පසුගියදා (26) රත්නපුර ශික්ෂණ රෝහල වෙත යුද හමුදාපතිවරයාගේ උපදෙස් මත ශ්‍රී ලංකා යුද හමුදාවේ ගැමුණු හේවා බළකායේ ප්‍රධානී කර්නල් කේ.එම්. දික්කුඹුර මහතාගේ අධීක්ෂණය යටතේ මේජර් සමත් රණසිංහ මහතා ඇතුළු 80කට අධික හමුදා සෙබළුන් පිරිසක් එක්ව සිටියහ. රත්නපුර ශික්ෂණ රෝහලේ ගොඩනැඟිලි සංකීර්ණය සහ අක්කර 50ක් පමණ භූමි භාගය මුළුමනින්ම පිරිසුදු කිරීම ශ්‍රී ලංකා යුද හමුදාව මඟින් සිදු කරනු ලබයි. මීට අමතරව රෝහල් පරිශ්‍රය සහ ඒ අවට කිලෝමීටරයක් පමණ වපසරියකින් යුක්ත ප්‍රදේශය මුළුමනින්ම ධූමායනය කිරීමට ද සෞඛ්‍ය අංශ කටයුතු කර තිබිණි.

සබරගමු පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් රෝහල් කාර්ය මණ්ඩලයට සහ පවිත්‍ර කටයුතුවල නිරත වන සේවකයන් වෙනුවෙන් ආයුර්වේද මදුරු විකර්ෂණ ආලේප සහ ප්‍රතිශක්තිජනක ද්‍රාවණ ප්‍රදානය ද මෙහිදී සිදු විය. පසුගිය 26 වැනිදා වන විට රත්නපුර දිස්ත්‍රික්කයෙන් සමස්ත ඩෙංගු රෝගීන් 1,465ක් වාර්තා වී තිබිණි. ඒ අතුරින් රත්නපුර මහ නගර සභා බල ප්‍රදේශයේ රෝගීන් 443ක් ද, රත්නපුර ශික්ෂණ රෝහලේ කාර්ය මණ්ඩලය 166ක් ද පමණ මේ වන විට ඩෙංගු රෝගයට ගොදුරු වී ඇත. රත්නපුර ශික්ෂණ රෝහලේ සේවය කරන හෙද නිලධාරීන් ද ඩෙංගු රෝගයට ගොදුරු වී ඇති බැවින් ප්‍රතිකාර සේවා බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යෑම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය මත අද (28) දින වන විට රත්නපුර හෙද විදුහලේ පුහුණුව නිම කළ නවක හෙද නිලධාරීන් 50ක් පමණ කඩිනමින් රත්නපුර ශික්ෂණ රෝහල වෙත බඳවා ගැනීමට පියවර ගෙන ඇතැයි සබරගමු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය කපිල කන්නන්ගර මහතා පැවසීය. මීට අමතරව පසුගියදා (26) කොළඹ ප්‍රදේශයේ රෝහල්වල සේවය කරන හෙද නිලධාරීන් දස දෙනකු රත්නපුර ශික්ෂණ රෝහල වෙත සේවය සඳහා වාර්තා කළ බවද ඒ මහතා වැඩිදුරටත් සඳහන් කළේය.

මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය ජනක සේනාරත්න, අමාත්‍යාංශයේ ලේකම් සුජීවා බෝධිමාන්න, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය අනුප් රුද්‍රිගු යන මහත්වරුන් ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

---

මිනුවන්ගොඩ

## පාප් වහන්සේ වෙනුවෙන් මෙරටදී දේව මෙහෙයක්



**මිනුවන්ගොඩ සමූහ - ටෙඩී කීර්ති**

ස්වර්ගස්ථ වූ ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ වෙනුවෙන් විශේෂ දේව මෙහෙයක් ශුද්ධ වූ ලෙයොනාර්දු මුනිදුන් නමින් මෙරට කැප කර ඇති එකම දේවස්ථානය ලෙස සැලකෙන කමරාගොඩ ශුද්ධ වූ ලෙයොනාර්දු මුනිඳුන්ගේ දේවස්ථානයේදී පැවැත්විණි.

මෙම මුනිවරයාණන් හට කැප කරන ලද දේවස්ථාන ලෝකයටම පිහිටුවා ඇත්තේ දෙකක් වන අතර, ඉන් එක් දේවස්ථානයක් මිනුවන්ගොඩ කමරාගොඩ ප්‍රදේශයේ පිහිටා තිබේ. අනෙක් දේවස්ථානය පිහිටා ඇත්තේ රෝමය තුළ වීමද විශේෂත්වයකි. ශුද්ධෝත්තම පාප් වහන්සේගේ දේහය මිහිදන් කරන ලද දින උදෑසන 6.00ට මෙම දේව මෙහෙය පැවැත්වූ අතර, ඒ සඳහා විශාල කිතුනු බැතිමතුන් පිරිසක් සහභාගී වී සිටියහ. එහිදී රැස්ව සිටි ජනතාව ස්වර්ගස්ථ වූ ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ වෙනුවෙන් විශේෂයෙන් යාඥා කළහ.

කමරාගොඩ ශුද්ධ වූ ලෙයොනාර්දු මුනිදුන්ගේ දේවස්ථානය හා එම මීසම භාර ටිරෝන් අජිත් පියතුමන් මෙම දේව මෙහෙය පැවැත්වූ අතර, එහිදී දේශනය පවත්වමින් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ආදර්ශමත් ජීවිතයක් ගත කළ ශුද්ධවත් පාප් වහන්සේ නමක් බවත්, විශේෂයෙන් සාමය උදෙසා මෙන්ම දුප්පතුන් වෙනුවෙන් හඬක් නැගූ පාප්තුමකු බවත් කීහ. එසේම උන්වහන්සේ ඉතා උසස් දූත කාර්යයක නිරත වූ බවත්, උන්වහන්සේගේ හඬ ක්‍රිස්තුස්වහන්සේගේ හඬ බවත් උන්වහන්සේගේ ජීවිතය අපේ ජීවිතවලට ආදර්ශයක් කරගෙන අපගේ ජීවිතය ද ගත කරමු යැයි ද අජිත් පියතුමන් සිය දේශනයේදී වැඩිදුරටත් පැවසූහ.

---

මිනුවන්ගොඩ

## නිවැසියන් දළදා වන්දනාවට ගිය අතරේ ගෙදරින් ලක්ෂ 6ක දේපොළ සොරාගෙන

**අනුරාධපුර සංචාරක - බී.ජී. චතුරංග**

අනුරාධපුර, විජයපුර ප්‍රදේශයේ පදිංචි යුවළක්, මහනුවර දළදා වන්දනාවට ගිය අවස්ථාවේදී එම නිවෙසේ තිබූ රුපියල් ලක්ෂ 6කට ආසන්න මුදල් හා දේපොළ සොරකම් කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් විමර්ශනයක් ආරම්භ කළ බව අනුරාධපුර මූලස්ථාන පොලීසිය පැවසීය.

පොලීසිය කියා සිටියේ, දෙමහල් නිවෙසක පදිංචි පැමිණිලිකරු බිරිය සමඟ උඩුමහලේ ජීවත්වන බවත්, බිම් මහලේ කාමර දෙකක් කුලී පදනම මත ලබා දී ඇති බවත්ය. නිවෙසේ කුලී පදනම මත සිටින පුද්ගලයා ඇමතුමක් ලබා දෙමින් උඩුමහලේ කාමරයේ ජනේලයක් කඩා දමා ඇති බව දැනුම් දීමෙන් අනතුරුව වහා පැමිණ නිවෙස පරීක්ෂා කිරීමේදී තමාගේ සහ නිවෙසේ ඉදිරි කාමරයේ කුලී පදනම මත පදිංචිව සිටි අයගේ රුපියල් 586,400ක් වටිනා මුදල් සහ දේපොළ සොරකම් කර ඇති බව පැමිණිල්ලේ සඳහන් වේ.

රුපියල් 70,000ක් වටිනා විස්කි බෝතල් හතක්, ලක්ෂ හතරක් වටිනා රන්මාලයක්, මුදලින් රුපියල් 110,000ක්, රුපියල් 6,400ක් වටිනා ආහාර තොගයක් මෙසේ සොරකම් කර ඇති බව පැමිණිල්ලේ වැඩිදුරටත් සඳහන් කර තිබේ. මෙම සොරකමට සම්බන්ධ පුද්ගලයකු හෝ පිරිසක් අත්අඩංගුවට ගැනීම සඳහා අනුරාධපුර මූලස්ථාන පොලීසියේ නිලධාරීන් කණ්ඩායමක් වැඩිදුර විමර්ශන සිදු කරයි.

## මාතලේ විජය ජාතික පාසලේ මාධ්‍ය දින සැමරුම උත්කර්ෂවත්ව

**මාතලේ මධ්‍යම සමූහ**

මාතලේ විජය ජාතික පාසලේ වාර්ෂික මාධ්‍ය දින සැමරුම් උත්සවය 'රාව' නමින් එම විද්‍යාලයේ ශ්‍රවණාගාරයේදී පසුගියදා පැවැත්විණි.

එම විද්‍යාලයේ දූ දරුවන්ගේ ඡායාරූපකරණය, නිවේදනය, වාර්තාකරණය හා ජනමාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ අංශයන්ගෙන් පැවැති තරගවලින් ජයග්‍රහණය ලැබූ දූ දරුවන්ට ත්‍යාග හා සහතික පත් ප්‍රදානයත්, විද්‍යාලයේ නර්තන හා සංගීතාංශයේ දක්ෂතා කළඑළිදැක්වීමත් මෙහිදී සිදු කෙරිණි.

මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මාධ්‍යවේදී කල්‍යාණ අලවත්තේගම මහතා සහභාගී වූ අතර, විද්‍යාලයේ විදුහල්පති රජිත තීක්ෂණ මහතාගේ මෙහෙයවීමෙන් මෙම වැඩසටහන සංවිධානය කර තිබුණි. මාධ්‍යවේදී අලවත්තේගම මහතාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් විද්‍යාලයේ පුස්තකාලය සඳහා පොත් පරිත්‍යාග කිරීමක් ද සිදු විය. මෙම අවස්ථාවට විද්‍යාලයේ සහකාර විදුහල්පතිනි ලිලානි ගනේගොඩ මහත්මිය, මාධ්‍ය අංශය භාර ආචාර්ය චතුරිකා ගුණසේකර මහත්මිය ඇතුළු පිරිසක් එක් වූහ.





---

## නිෂ්පාදනය පහළ බැහැලා: මාතලේ ලොකු ලූනු බීජ මිල ඉහළට

**ගලේවෙල මධ්‍යම සමූහ**

මාතලේ දිස්ත්‍රික්කයේ ලොකු ලූනු බීජ මිල ඉහළ යෑම නිසා ගොවීහු දැඩි අපහසුතාවට පත්ව සිටිති.

ඒ අනුව, පසුගිය වසරවල රුපියල් 20,000ත් 25,000ත් අතර තිබූ ලොකු ලූනු බීජ කිලෝව මෙවර රුපියල් 40,000ක් දක්වා ඉහළ ගොස් ඇති බව ඔවුහු පවසති. පසුගිය කාලයේ ප්‍රදේශයට ඇදහැලුණු අධික වර්ෂාව හේතුවෙන් බීජ නිෂ්පාදනය අඩු වීම හේතුවෙන් නිෂ්පාදන මිල ඉහළ යෑම ඊට හේතු ලෙස දැක්විය හැකි බව දඹුල්ල මූලස්ථාන කෘෂිකර්ම උපදේශක ඒ.එම්. සුනිල් බණ්ඩාර මහතා පැවැසීය. ඊට අමතරව ලූනු බීජ පරාගණය කිරීමට නොහැකි වීම, උෂ්ණත්වය අඩු වීම, කෘමීන්ගෙන් ලූනු මල් පරාගණය නොවීම ආදිය ඊට හේතු ලෙස දැක්විය හැකිය. මෙවර මාතලේ දිස්ත්‍රික්කයේ ලූනු බල්බ කිලෝ 40,000ක් වසන්තීකරණය කර සිටුවා ඇත. පෙර වර්ෂවලදී ලූනු බල්බ කිලෝ 10කට බීජ කිලෝ 1ක් ලබා ගත්තත් ඉහත කී හේතූන් මත මේ වසරේ යල කන්නයේ ලූනු බල්බ කිලෝ 15කට බීජ කිලෝ 1ක් පමණක් ලබා ගැනීමට හැකිව ඇති බව කෘෂි නිලධාරීහු පවසති. මාතලේ දිස්ත්‍රික්කයේ ලොකු ලූනු වගා කිරීමට බීජ කිලෝ 10,000ක් පමණ අවශ්‍ය වී ඇතත් නිෂ්පාදනය කිරීමට හැකිව ඇත්තේ බීජ කිලෝ 2,500ක් පමණ බව කෘෂි නිලධාරීහු පවසති.



දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලූනු බීජ ගුණාත්මක අතින් ඉහළ බැවින් ගොවීහු එම බීජ වගා කිරීමට වැඩි කැමැත්තක් දක්වති. ඔවුන් පෙන්වා දෙන්නේ, ඉල්ලුමට සරිලන සැපයුම ලබා දීමට නොහැකි තත්ත්වයක් තුළ ලූනු බීජ ආනයනය කිරීමට සිදු විය හැකි බවයි. කෙසේ වෙතත් ලූනු බීජ නිෂ්පාදනය කරන ගොවියා ආරක්ෂා කර ගැනීමට හා දේශීය ලොකු ලූනු වගාව ප්‍රවර්ධනය කිරීමට නවීන තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගැනීම කෙරෙහි වගකිවයුත්තන්ගේ අවධානය වහා යොමු විය යුතුව ඇත.

---

මිනුවන්ගොඩ

## වන සතුන් දඩයමට ඇද්ද විදුලිය දෙදරු පියාට මරු කැඳවයි

**පොල්පිතිගම සමූහ - නන්දන කැලේගම**

වන සතුන් දඩයම් කිරීමට අනවසරයෙන් අදින ලද විදුලි රැහැනක පැටලී දෙදරු පියකු මරණයට පත් කිරීමේ සිද්ධියකට සැකපිට පුද්ගලයකු පසුගියදා (26) අත්අඩංගුවට ගත් බව පන්සියගම පොලීසිය පැවසීය.

මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත්තේ මඩහපොළ, වෙහෙරගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. පුරන් කුඹුරක් වටා අදින ලද විදුලි රැහැනක ගැටී මඩහපොළ, වෙහෙරගල ලිපිනයේ පදිංචිව සිටි පී.ඩී. ගයාන් ලෙස්ලි ගුණරත්න නමැති 41 හැවිරිදි දෙදරු පියකු ජීවිතක්ෂයට පත්ව සිටියදී සොයා ගත් බව පොලීසිය සඳහන් කළේය. ඔහු ඉකුත් 23 වැනිදා රාත්‍රියේ නිවෙසින් දානමය පිංකමකට සහභාගී වීමට පිටත්ව ගොස් ඇති අතර, පසුදා (24) දහවල් දක්වාම ආපසු නොපැමිණීම සම්බන්ධයෙන් සිදු කළ සොයා බැලීමේදී සතුන් දඩයම් කිරීමට අදින ලද විදුලි රැහැනක ගැටී මරණයට පත්ව සිටි බව පොලීසිය අනාවරණය කරගෙන තිබේ.

---

## මාතර බන්ධනාගාර කෝලාහලයේ වැඩිම අලාභය බෙහෙත්වලට

## බන්ධනාගාර වාට්ටුවල දේපොළත් වනසලා

**ගන්දර සමූහ - ජයසිරි ජේදුරුආරච්චි**

මාතර බන්ධනාගාරයේ සිදුවූ කලහකාරී සිදුවීමේදී වැඩිම අලාභය බන්ධනාගාරය තුළ වූ රෝහලේ බෙහෙත්වලට සිදුව ඇති බවට පොලිස් විමර්ශනවලින් අනාවරණය වෙමින් පවතී.

එහිදී ආසන්න දිනවලදී බන්ධනාගාර රෝහල වෙත ගෙන එන ලද රුපියල් ලක්ෂ පහළොවකට අධික බෙහෙත් ද තිබී ඇතැයි පොලීසිය පවසයි.

බන්ධනාගාරය තුළ පිහිටි රෝහල කඩා ඊට ඇතුළු වී ඇති ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු රැඳවූවන් ගබඩා හා ඖෂධ බහාලූ ස්ථාන කඩා රෝහල තුළ තිබූ මානසික රෝගීන් සඳහා ලබා දෙන ඖෂධ වර්ග ලබාගෙන එය පානය කර ඇති බවත්, අනෙකුත් ඖෂධ කඩා විසි කර දමා ඇති බවත් අනාවරණය වූ බව පොලීසිය පැවසීය.

මෙයට අමතරව ආහාර ගබඩා, සිරකරුවන් ඇතුළත් කර ගැනීමේදී ඔවුන් සතුව ඇති මුදල්, රන් ආභරණ, ජංගම දුරකතන ඇතුළු දෑ තැන්පත් කර තිබූ ආරක්ෂිත සේප්පු ද රැඳවූවන් විසින් කඩා බිඳ දමන ලදුව එහි තිබූ දේවල් පැහැරගෙන ඇත. බන්ධනාගාරයේ වාට්ටුවල දොර ජනෙල් ද කඩා බිඳ දමා ඇති අතර, එමඟින් ද විශාල හානියක් සිදු කර තිබේ.

ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරුණු රැඳවූවන් බන්ධනාගාරය තුළට කෙතරම් අලාභහානි සිදු කළද රැඳවූවන් ලියාපදිංචි කරන තොරතුරු සහිත ලිපි ලේඛන ඇති කාමරයට කිසිදු හානියක් සිදු නොකිරීම විශේෂිත කාරණාවක් ලෙස පරීක්ෂණ පවත්වන පොලිස් කණ්ඩායම් හඳුනාගෙන ඇත.

---

## උණවටුන රථගාලෙන් ත්‍රිරෝදයක් නොගත්තැයි විදේශිකයකුට හා පිටින් ආ රියැදුරුට තර්ජනය කරලා

## සැකපිට ත්‍රිරෝද රියැදුරෙක් අත්අඩංගුවට

**දකුණු පළාත් සංචාරක - එස්. දීයගහගේ**

උණවටුන ප්‍රදේශයේ සංචාරක හෝටලයක් ඉදිරිපිට පිහිටි ත්‍රිරෝද රථගාලකින් ත්‍රිරෝදයක් ලබා නොගෙන ගාල්ල නගරයෙන් ත්‍රිරෝද රථයක් ගෙන්වා ගත් ජර්මන් ජාතිකයකුට සහ ගාල්ලෙන් පැමිණි ත්‍රිරෝද රථයේ රියැදුරුට බැණ තර්ජනය කිරීම සම්බන්ධයෙන් උණවටුන ත්‍රිරෝද රථගාලේ රියැදුරකු පසුගියදා (26) අත්අඩංගුවට ගත් බව හබරාදූව පොලීසිය පැවසීය.

මෙම ජර්මන් ජාතිකයා උණවටුනේ සංචාරක හෝටලයක පැවැති මංගල උත්සවයකට පැමිණ එම හෝටලය ඉදිරිපිට පිහිටි ත්‍රිරෝද රථගාල අසලට පැමිණ තමාට හුරුපුරුදු ත්‍රිරෝද රථයක් ගාල්ල නගරයෙන් ගෙන්වාගෙන තිබේ. එම අවස්ථාවේදී කෝපයට පත් සැකකාර උණවටුන ත්‍රිරෝද රථ ගාලේ රියැදුරා ජර්මන් ජාතිකයාට සහ ගාල්ලෙන් පැමිණි ත්‍රිරෝද රථ රියැදුරුට බැණ තර්ජනය කර ඇත. අනතුරුව මේ පිළිබඳ ලැබුණු පැමිණිල්ලක් මත සාපරාධී බලහත්කාරය පෑම සහ අයුතු අවහිර කිරීමේ චෝදනා මත හබරාදූව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කුමාර ද සිල්වා සහ උප පොලිස් පරීක්ෂක ප්‍රියංකර යන මහත්වරු සැකකාර ත්‍රිරෝද රියැදුරු අත්අඩංගුවට ගෙන තිබේ.

මේ අතර හබරාදූව පොලිස් වසමට පැමිණෙන විදේශීය සංචාරකයන්ට නිදහසේ සංචාරක කටයුතුවල යෙදීමට බාධා කරන ඕනෑම පුද්ගලයකුට විරුද්ධව නීතිය අකුරටම ක්‍රියාත්මක කරන බව හබරාදූව පොලිස් ස්ථානාධිපති කුමාර ද සිල්වා මහතා පැවසීය.

---

ආණමඩුව

## පරණ ටයර් ප්‍රවාහන ලොරියේ රෝදය ගැලවී ටයර් සී සීකඩ

## ගැලවුණු රෝදය හැපී යතුරුපැදිකරුවකුටත් තුවාල



**පුත්තලම - හිරාන් ප්‍රියංකර ජයසිංහ**

භාවිතා කළ ටයර් ප්‍රවාහනය කරමින් තිබූ ලොරි රථයක පිටුපස ටයරටක් ගැලවී යෑමෙන් කොට්ටුකච්චිය ආසන්නයේදී පෙරළී ගොස් ටයර් තොගය අසල කුඹුරකට විසිවී තිබූ බව ආණමඩුව පොලීසිය පැවසීය.

එම ලොරි රථයෙන් ගැලවී ආ රෝදය මාර්ගයේ අනෙක් දිසාවෙන් ගමන් කළ යතුරුපැදියක ගැටී ඇති බවත්, ඉන් යතුරුපැදිකරුගේ පාදයක දරුණු අස්ථි බිඳීමක් සිදුව තිබූ බවත් අනාවරණය වී තිබේ. පෙරළී ගිය ලොරි රථය කුරුණෑගල දෙස සිට පුත්තලමට ගමන් කරමින් තිබියදී අනතුර සිදු වී ඇති අතර, ඉන් ආණමඩුව කොට්ටුකච්චිය ආසන්නයේ කුඹුරු යායකට ටයර් තොගය විසිවී ගොස් තිබූ බවද පොලීසිය කීය.

අනතුරින් ලොරියේ ගැලවී ගිය පිටුපස රෝදයට අමතරව අනෙක් රෝදය ද ඇඹරී තිබුණි. ටයරය ගැටී අනතුරට ලක්වූ තැනැත්තා පුත්තලම මූලික රෝහලට ඇතුළත් කිරීමෙන් අනතුරුව ශල්‍යකර්මයකට භාජනය කළ බව රෝහල් ආරංචි මාර්ග පැවසීය.

---

## ජපන් වෛද්‍යවරුන්ගෙන් පොලොන්නරුවේදී ළමා දන්ත සායනයක්

**ලංකාපුර සමූහ**
**එච්.එල්. ද සොයිසා**



ජපානයේ හොකයිදෝ විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක සහයෝගිතා වැඩසටහන යටතේ එරට වෛද්‍ය කණ්ඩායමකගේ සහභාගීත්වයෙන් පසුගිය සතියේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ තෝරා ගත් පාසල් තුනක දරුවන් සඳහා ඒ ඒ පාසල්වලදී මුඛ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්විණි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් පොලොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දන්ත වෛද්‍ය ප්‍රසංග රත්නායක මහතා ප්‍රමුඛ දන්ත චිකිත්සක අංශයේ සංවිධානත්වයෙන් සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ සහයෝගයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි. එම වැඩසටහන සඳහා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිඟුරක්දමන මහා විද්‍යාලය ද නම් කර තිබූ අතර, විදුහලේ හය හත ශ්‍රේණිවල දරුවන්ට මුඛ සෞඛ්‍ය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබාදීමට කටයුතු කර ඇත.

මෙහිදී වැඩසටහනට සම්බන්ධ වූ සිසුන් අතර මුඛ සෞඛ්‍ය පිළිබඳ දැනුම මිනුම තරගයක් ද පැවැත්විණි. එම තරගයෙන් ජයගත් අයට පදක්කම් පැළඳවීම හා තිළිණ ප්‍රදානය විදුහල්පති ඊශාන් සෙනෙවිරත්න මහතාගේ අතින් සිදු විය. මෙහිදී ප්‍රතිකාර කළ යුතු තත්ත්වයේ සිටි දරුවන්ට ජංගම දන්ත ප්‍රතිකාර රථය තුළදී ප්‍රතිකාර ලබාදීම ද සිදු විය. එමෙන්ම ඉලක්ක කණ්ඩායම්වලට අමතරව එම පාසලේ සියලුම දරුවන්ට දත් බෙහෙත්, දත් බුරුසු සහ පෝෂ්‍යදායි ආහාර පැකට්ටුව බැගින් ලබාදීමට ද කටයුතු කෙරිණි.

මෙම වැඩසටහන සඳහා ජපානයේ හොකයිදෝ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සමසකි කද්සු මහතා ප්‍රමුඛව මුඛ සෞඛ්‍ය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරියක් හා දන්ත වෛද්‍යවරියක් සමඟ දන්ත චිකිත්සකවරියක් ඇතුළු හතර දෙනකුගෙන් සමන්විත වෛද්‍ය කණ්ඩායමක් පැමිණ තිබිණි.

ඊට අමතරව ශ්‍රී ලාංකික වෛද්‍යවරුන් වන විශේෂඥ වෛද්‍ය එම්.එච්. අබුසයි මහතා, පොලොන්නරුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දන්ත චිකිත්සක අංශයේ දන්ත වෛද්‍ය ප්‍රසංග රත්නායක මහතා ප්‍රමුඛ දන්ත චිකිත්සකවරියන් පිරිසක් ද වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා එක්ව සිටියහ.